00002

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය ඩිප්ලෝමා වැඩ සටහන - 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2020/2021

**EPE2517/ ESC2217 -** මුල් ළමාවිය අධ්‍යාපනය පිළිබඳ සමාජ සංස්කෘතික පර්යාලෝක

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2023.07.01 වේලාව - පෙ.ව 09.30 - ප.ව.12.30 දක්වා

---

පළමු වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, දෙවන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## පළමු වන කොටස

01. පහත සඳහන් පද නිර්වචනය කර ඒවා අතර වෙනස පැහැදිලි කරන්න.
    - i. න්‍යෂ්ටික පවුල
    - ii. විස්තෘත පවුල

02. දෙමාපියන්ට තම දරුවන්ගේ කියැවීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා අනුගමනය කළ හැකි පියවර පහක් (05) සඳහන් කරන්න.

03. “Save the Children” ආයතනය විසින් ඇස්තමේන්තු කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ පමණක් මව්වරුන් රැකියා සඳහා විදේශගත වීමට බලපෑම් කෙරෙන නිසා දරුවන් මිලියනයකට වඩා අත්හැර දමා ඇති බවයි.

    ඉහත තත්ත්වය පිළිබඳ බලපෑම් පහක් (05) ලැයිස්තුගත කරන්න.

04. අවුරුදු 04 සිට 05 අතර දරුවන්ගේ සමාජ සංවර්ධනයට බලපාන සාධක දෙක (02) කුමක් ද?

05. මුල් ළමාවියේ දරුවන්ට (Smart Phone) ස්මාර්ට් ෆෝන් සෙල්ලම් කිරීමෙන් ඇතිවන බලපෑම් පහක් (05) ලැයිස්තු ගත කරන්න.

06. “ ‘ස්වභාවිකවාදය’ ස්වභාවික නිදහස තුළින් ජීන් ජැක් රූසෝ විසින් නිර්මාණය කරන ලදී.”

    ස්වභාවිකවාද ප්‍රවේශය කෙටියෙන් පැහැදිලි කරන්න.

07. ළමා කේන්ද්‍රීය අධ්‍යාපනය සඳහා මාරියා මොන්ටිසෝරිගේ දායකත්වය පැහැදිලි කරන්න.

08. ශ්‍රී ලංකාවේ අවදානමට ලක්විය හැකි ළමුන් සඳහා ඔබට සලකා බැලිය හැකි කණ්ඩායම් ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## දෙවන කොටස

09. "සමාජානුයෝජන ක්‍රියාවලියේ දී සමාජ අන්තර් ක්‍රියා සහ සමවයස් මිතුරන්ගේ සහාය ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි."

(i) පෙරපාසල් ළමුන් සමාජගත කිරීමට සම වයසේ මිතුරන්ගේ අන්තර් ක්‍රියා උපකාර වන ආකාරය උචිත උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) නිදසුන් මගින් කුඩා දරුවන් සමාජගත කිරීම සඳහා පවුලේ බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 10)

10. (i) මුල් ළමාවියේ දී තම දරුවන්ට රැකවරණය සැපයීමේ දී තනි මාපිය පවුල මුහුණ දෙන ගැටළු හතරක් **(04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා පවුලේ දායකත්වය විස්තර කරන්න. (ලකුණු 06)

(iii) තම දරුවන්ට උදව් කිරීම සම්බන්ධයෙන් දෙමාපියන් දැනුවත් කිරීමේ දී ඔබ අවධානය යොමු කළයුතු කරුණු තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) දරුවන්ට බලපෑම් ඇති කළහැකි ජනමාධ්‍ය වර්ග හතරක් **(04)** නම් කරන්න. (ලකුණු 06)

(ii) ඔබ ඉහත සඳහන් කළ ඕනෑම වර්ගයක් තෝරා ගෙන එය දරුවන්ට බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

a) බුද්ධි සංවර්ධනය
b) චිත්තවේගී සංවර්ධනය (ලකුණු 7 x 2 = 14)

12. "දෙමාපියන් අතලොස්සක් තම දරුවන්ගේ රැකවරණය හා ආරක්ෂාව පිළිබඳ ව දක්වන සැලකිල්ල අඩුබව දැකිය හැකි ය."

(i) ඉහත වගන්තිය සමඟ ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

(ii) ඉහත තත්ත්වයට බලපෑ හේතු තුනක් **(03)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 06)

(iii) එවැනි තත්ත්වයන් මඟහරවා ගැනීමට පෙරපාසල් ගුරුවරයාට ගත හැකි පියවර මොනවා ද? (ලකුණු 08)

13. (i) මුල් ළමාවියේ දරුවන්ගේ සමස්ත සංවර්ධනය සඳහා නිවසේ භෞතික පරිසරයේ බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) මුල් ළමාවියේ දරුවන්ගේ සමස්ත සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා පෙරපාසලේ භෞතික පරිසරය සකස් කරන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.